ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2026 අංක 27 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත

[සභතිකය සටහන් කළේ 2026 ඔක්තෝබර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

2026 ඔක්තෝබර් මස 30 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 20.00 **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2026 අංක 27 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත

[සභාතිකය සටහන් කළේ 2026 ඔක්තෝබර් මස 30 වන දින]

එල්.ඩී. - ඕ 11/2026

(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2026 අංක 27 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

218 වන අධිකාරයේ 54අ වන වගන්තිය සංශෝධනය කිරීම

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 54අ වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "හෙරොයින් හෝ කොකේන් හෝ මෝෆින් හෝ අබිං" යන වචන වෙනුවට "හෙරොයින්, කොකේන්, මෝෆින්, අබිං හෝ මෙත්ඇම්පිටමින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(අඅ) හෙරොයින්, කොකේන්, මෝෆින්, අබිං සහ මෙත්ඇම්පිටමින් හැර, තුන්වන උපලේඛනයේ I වන කොටසේ අ, ආ, ඇ, ඈ සහ ඉ වන විනාඃසවල දක්වා ඇති යම් අන්තරායදායක ඖෂධයක් නිෂ්පාදනය කරන යම් තැනැත්තකු මේ ආඥාපනතට විරුද්ධ වූ වරදකට වරදකරු වන අතර, ජූරි සභාවක් රහිත මහාධිකරණය විසින්

වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දහයකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 54අඅ වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 54අඅ වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, "හෙරොයින්, කොකේන්, මෝෆින් හෝ අබිං" යන වචන වෙනුවට "හෙරොයින්, කොකේන්, මෝෆින්, අබිං හෝ මෙත්ඇම්පිටමීන්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) 84 වන සහ 85 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 54අ වන වගන්තියේ (1) වන උපවගන්තිය, 54අඅ වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති සහ 54ආ වන වගන්තිය යටතේ වන වරදක් සඳහා සැකකරුවකු හෝ චූදිතයකු වන්නා වූ තැනැත්තකු-

(අ) ඒ වරද සිදු කිරීමේ දී ජාවාරම් කරන ලද, ආනයනය කරන ලද, අපනයනය කරන ලද හෝ සන්තකයේ තබා ගන්නා ලද අන්තරායදායක ඖෂධයේ ශුද්ධ බර 77අ වන වගන්තිය යටතේ ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා විසින් නිකුත් කරන ලද වාර්තාව ප්‍රකාරව ග්‍රෑම් සියයක් හෝ ඊට වැඩි වන්නා වූ විට හෝ, ඒ වාර්තාව

නොමැති අවස්ථාවක දී, ජාවාරම් කරන ලද, ආනයනය කරන ලද, අපනයනය කරන ලද හෝ සන්තකයේ තබා ගන්නා ලද අන්තරායදායක ඖෂධයේ දළ බර ග්‍රෑම් සියයක් හෝ ඊට වැඩි වන්නා වූ විට; සහ

(ආ) සිදු කරන ලද ඒ වරද මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් වන්නා වූ විට,

අභියාචනාධිකරණය විසින් විශේෂ අවස්ථානුගත කරුණුවල දී මිස, ඇප මත නිදහස් කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් සංජානනය කර අධිකරණ බලය පිළිගනු ලබන අවස්ථාවක දී, අභියාචනාධිකරණය විසින් සිය අභිමතය ක්‍රියාත්මක කරමින් ඒ කාරණය අදාළ මහාධිකරණය වෙත මාරු කළ යුතු බවට විධාන කරන්නේ නම් මිස, 77අ වන වගන්තිය යටතේ වන ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා විසින් නිකුත් කරන ලද වාර්තාව මගින් අන්තරායදායක ඖෂධයේ ශුද්ධ බර ග්‍රෑම් සියයට වඩා අඩු බවට පසුව අනාවරණය වුව ද ඒ බව නොතකා, අභියාචනාධිකරණය විසින් ඒ කාරණය සම්බන්ධයෙන් අධිකරණ බලය අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ I වන කොටසේ "ආ" විනාසයේ 1 වන කොටසේ-

(අ) 26 වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"26	කැනබිස්	කැනබිස් ශාකයේ මල් හෝ ඵල දරන මුදුන් කොටස් (නිස්සාරණය නොකරන ලද රෙසින)";

(ආ) 26 වන අයිතමයට ඉක්බිනිව ම පහත දැක්වෙන අයිතම ඇතුළත් කිරීමෙන්:-

"26අ	කැනබිස්	කැනබිස් සැටිවා එල්.
26ආ	කැනබිස්	කැනබිස් සැටිවා එල්. හි යම් ගැලෙනිකල් (galenical) පිළියෙල කිරීමක්"; සහ

(ඇ) 27 වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"27	කැනබිස් රෙසින, නිස්සාරණ සහ ද්‍රාවණ	කැනබිස් ශාකයෙන් ලබා ගන්නා ලද (ශුද්ධ නොකරන ලද හෝ ශුද්ධ කරන ලද) වෙන් කරන ලද රෙසින"; සහ

(2) ඒ උපලේඛනයේ III වන කොටසේ -

(අ) "(54අ වන වගන්තිය)" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(54අ වන සහ 54අඅ වන වගන්ති)" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපලේඛනයේ වගුවේ "කැනබිස්" යන අනුශීර්ෂය වෙනුවට "කැනබිස් / කැනබිස් සැටිවා එල්. / කැනබිස් සැටිවා එල්. හි යම් ගැලෙනිකල් (galenical) පිළියෙල කිරීමක්" යන අනුශීර්ෂය ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනක්, අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැක.